සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

62 S I, II

115528

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2015

පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය I, II
குடியுரிமைக் கல்வி மற்றும் சமூக நிர்வாகம் I, II
Citizenship Education & Governance I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

විභාග අංකය :..............................

## (62) පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය I

* මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40** කින් සමන්විත ය.
* එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව **සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**

- අංක **1** සිට **10** තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයේ හිස්තැනට සුදුසු වචනය/වචන වරහන තුළින් තෝරා, **තීන් ඉර මත** ලියන්න.

1. ප්‍රජාතන්ත්‍රවාදයේ නිජබිම ලෙස සලකනු ලබන්නේ .......................................... යි.
(මහා බ්‍රිතාන්‍යය / ග්‍රීසිය / ස්විට්සර්ලන්තය)

2. ජෝන් ලොක් ඉදිරිපත් කළ දේශපාලන මතවාදය .............................................. යි.
(පැරණි ලිබරල්වාදය / නව ලිබරල්වාදය / ඍජු ප්‍රජාතන්ත්‍රවාදය)

3. ව්‍යවස්ථාදායකයෙන් කෙරෙන ප්‍රධාන කාර්යය වන්නේ ................................................... යි.
(අය-වැය සම්මත කිරීම / විවාද පැවැත්වීම / නීති පැනවීම)

4. පළාත් සභාවක සංයුතිය තීරණය කිරීම සිදු කර ඇත්තේ ජනගහනය හා ...................................... අනුව ය.
(භූමි ප්‍රමාණය / සම්පත් / ජනවර්ග)

5. පළාත් සභාවක මූල්‍ය පාලනය සඳහා පිහිටුවා ඇති පළාත් සභා අරමුදලේ අවසාන භාරකාරත්වය දරන්නේ ........... ................................ ය.
(ගණකාධිකාරිවරයා / ආණ්ඩුකාරවරයා / ප්‍රධාන අමාත්‍යවරයා)

6. තම සංස්කෘතියේ ප්‍රගමනය සඳහා වෙනත් සංස්කෘතියක අංග එකතු කර ගැනීම ................................ විසරණයයි.
(ඍජු / අන්තර් සම්බන්ධතා / ප්‍රබෝධාත්මක )

7. ගැටුම් නිරාකරණයේ දී තම මතය පමණක් නොව වෙනත් විසඳුම් ද පවතින බව පිළිගැනීම ............................ ................. යි.
(සහමන්ත්‍රණය / විකල්ප ජනනය / සමථකරණය)

8. නීතියට අනුව පාලනය කිරීම නීතියේ ...................................... ලෙස හැඳින්වේ.
(සාධාරණත්වය / බලතල / ආධිපත්‍යය )

9. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි පුරවැසියන් සතු මූලික යුතුකම් පිළිබඳ ව ........... වැනි වගන්තිය මගින් දක්වා ඇත.
(14 / 15 / 28)

10. එක්සත් ජාතීන්ගේ ප්‍රධාන ආයතන හයෙන් එකක් ලෙස .................................................... හැඳින්විය හැකි ය.
(අන්තර්ජාතික මූල්‍ය අරමුදල / අන්තර්ජාතික අධිකරණය / අන්තර්ජාතික සංවර්ධන සංගමය)

[දෙවැනි පිටුව බලන්න.

- අංක **11** සිට **20** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් හරි (√) ලකුණ ද වැරදි නම් වැරදි (X) ලකුණ ද ඉදිරියේ ඇති **වරහන තුළ** ලකුණු කරන්න.

**11.** එංගලන්තය බහු පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වන රටකි. (.........)

**12.** ග්‍රීසියේ ඇතැන්ස් නුවර පැවති සෘජු ප්‍රජාතන්ත්‍රවාදී පාලනය යටතේ කාන්තාවන් හා වහලුන් හැර අන් සියලු ම පුරවැසියන්ට පාලනයට සහභාගිවීමේ අවස්ථාව හිමි විය. (.........)

**13.** ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන පාලනය වන්නේ පළාත් සභා යටතේ ය. (.........)

**14.** මිනිසුන්ගේ බාහිර පැවැත්ම පාලනය කිරීම සඳහා රජයක් විසින් පනවනු ලබන රෙගුලාසි හඳුන්වනු ලබන්නේ 'පනත්' යනුවෙනි. (.........)

**15.** 'තේසවලාමෙයි' නීතිය යටතේ දේපළ පාලනය සම්පූර්ණයෙන් ම ස්වාමි පුරුෂයා සතු වේ. (.........)

**16.** රජයේ උපරිම මැදිහත් වීම තුළින් වෙළෙඳපොළ ක්‍රියාත්මක වීමට ඉඩ සැලසීම වෙළෙඳපොළ ආර්ථිකය ලෙස හැඳින්වේ. (.........)

**17.** බලය බෙදාහැරීමක් සහිත රාජ්‍ය 'සන්ධීය' රාජ්‍ය ලෙස සැලකේ. (.........)

**18.** බහු පක්ෂ ක්‍රමය මගින් මහජන මතය නියෝජනයට වැඩි ඉඩප්‍රස්තා ලබාදීම සිදු වේ. (.........)

**19.** ආරවුලක් විසඳීම සඳහා මැදිහත් වන පුද්ගලයා හෝ පුද්ගල කණ්ඩායම 'ජූරිය' ලෙස හැඳින්වේ. (.........)

**20.** උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය හෙවත් නේටෝ (NATO) කලාපීය ආර්ථික සහයෝගිතාව උදෙසා පිහිටුවා ගත් සංවිධානයකි. (.........)

- අංක **21** සිට **30** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයේ හිස්තැනට සුදුසු වචනය/වචන යොදා සම්පූර්ණ කරන්න.

**21.** 'කැන්ටන්' නමින් හැඳින්වෙන ප්‍රාන්ත රාජ්‍ය 26කින් සමන්විත සන්ධීය රාජ්‍යය වන්නේ .................................. .................................................... යි.

**22.** ජනාධිපති ආණ්ඩුක්‍රමයක විශේෂ ලක්ෂණයක් වන්නේ විධායකය .................................... ට වගකීමට බැඳීමක් නොමැති වීමයි.

**23.** විවිධ ජනවර්ග, ආගම් හා භාෂාවලින් යුතු කණ්ඩායම් එකට ජීවත්වන සමාජයක් .............................. සමාජයක් ලෙස හැඳින්වේ.

**24.** නිෂ්පාදනයේ දී හෝ පරිභෝජනයේ දී පිරිවැයක් දැරීමට සිදු වන්නේ ................................ භාණ්ඩ සඳහා ය.

**25.** අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයා.................................... වන අතර, ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරු දෙදෙනෙක් එහි සෙසු සාමාජිකයෝ වෙති.

**26.** ඉස්ලාම් නීතියේ එක් මූලාශ්‍රයක් ලෙස සැලකෙන ................................................ හි නබි නායකතුමාගෙන් පසු ආගම පිළිබඳ නීති විශාරදයන් එළඹෙන ලද ඒකමතික තීරණ අඩංගු වේ.

**27.** කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කම් තුරන් කිරීම සඳහා .............................. සම්මුතිය සම්මත කරගෙන ඇත.

**28.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව රජයේ පරිපාලන ක්‍රියාවක් හේතුවෙන් යම් පුරවැසියකුගේ මූලික අයිතිවාසිකම් කඩවීමක් සිදුවුවහොත් ඒ පිළිබඳ ව පැමිණිලි කළ යුත්තේ ...................................... වෙතට ය.

**29.** පැවරෙන වගකීම ඉටු කිරීම සම්බන්ධයෙන් වූ බැඳීම .............................................. යනුවෙන් හඳුන්වයි.

**30.** සංවර්ධනය මැනීමේ දී ආර්ථික දියුණුව මැනීමට යොදා ගන්නා මිනුම් අයත් වන්නේ .............................. මිනුම් ගණයට ය.

[තුන්වැනි පිටුව බලන්න.

- අංක **31** සිට **40** තෙක් ප්‍රශ්නවලට දී ඇති වරණවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ වරණය තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**31.** පහත ක්‍රමවේද අතුරෙන් නියෝජන ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් යටතේ සෘජුව ම ඡන්දදායකයන්ගේ අදහස් විමසුමට ලක්කෙරෙන ක්‍රමවේදය කුමක් ද?
(1) පොදු ජනතාව සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම
(2) ජනමාධ්‍ය මගින් ජනතාවගේ අදහස් ලබා ගැනීම
(3) කොමිෂන් සභා මගින් ජනතාවගෙන් සාක්ෂි කැඳවීම
(4) ජනමත විචාරණයක් මගින් අදහස් විමසීම (......)

**32.** පහත දැක්වෙන රටවල් අතුරෙන් ඒකීය ආණ්ඩුක්‍රමයක් ක්‍රියාත්මක වන්නේ කුමන රටේ ද?
(1) ප්‍රංශය (2) ඉන්දියාව
(3) නවසීලන්තය (4) ඇමෙරිකා එක්සත් ජනපදය (......)

**33.** පහත '**අ**' තීරුවේ ගැටුම් වර්ග ද '**ආ**' තීරුවේ ඒවාට නිදසුන් ද දක්වා ඇත.

| '**අ**' | '**ආ**' |
|---|---|
| (i) දේශපාලන ගැටුම් | (a) කුරුස යුද්ධ |
| (ii) ආගමික ගැටුම් | (b) ඊශ්‍රායලය හා පලස්තීනය අතර ගැටුම් |
| (iii) දේශසීමා ගැටුම් | (c) හින්දූන් හා හරිජනයා අතර ගැටුම් |
| (iv) ගෝත්‍ර හා කුල ගැටුම් | (d) ඉන්දුනීසියාව හා නැගෙනහිර ටිමෝරය අතර ගැටුම් |
| | (e) ඉරාකය හා ඇමරිකා එක්සත් ජනපදය අතර ගැටුම් |

'**අ**' තීරුවේ අනුපිළිවෙළට '**ආ**' තීරුවේ නිදසුන් ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන වරණය තෝරන්න.
(1) c, a, b, e (2) d, a, b, c (3) d, a, e, c (4) e, b, a, c (......)

**34.** 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ හඳුන්වා දුන් සංචෘත ලැයිස්තුවට අයත් විෂය යුගලයක් සඳහන් වරණය තෝරන්න.
(1) රාජ්‍ය ආරක්ෂාව, විදේශ කටයුතු (2) පළාත් පාලන කටයුතු, පළාත්වල නිවාස ඉදිකිරීම්
(3) ඉඩම්, වාරිමාර්ග (4) කෘෂිකර්ම, ගොවිජන සේවා (......)

**35.** නීතියේ මූලික අරමුණ වන්නේ,
(1) රටේ සියලු පුරවැසියන්ට සාමය ලබා දීම ය. (2) රටේ සියලු පුරවැසියන්ට යුක්තිය ඉටු කිරීම ය.
(3) රටේ සියලු වැරදිකරුවන්ට දඬුවම් ලබා දීම ය. (4) රටේ අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම ය.
(......)

**36.** මහාධිකරණය මගින් විභාග කරනු ලබන නඩු පමණක් අඩංගු වරණය කුමක් ද?
(1) රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණ, දික්කසාද නඩු, මිනීමැරුම්
(2) ස්ත්‍රී දූෂණ, මිනී මැරීමට තැත් කිරීම, සියලු ම ඉඩම් නඩු
(3) මිනී මැරුම්, ස්ත්‍රී දූෂණ, රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණ
(4) ස්ත්‍රී දූෂණ, බූදල් නඩු, බෙදුම් නඩු (......)

**37.** ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියකු විසින් ඉටු කළ යුතු නීතිමය යුතුකමක් වන්නේ,
(1) විශේෂ අවශ්‍යතා ඇති අයට උදව් කිරීම ය. (2) පොදු දේපළ ආරක්ෂා කිරීම ය.
(3) ගුරුවරුන්ට ගරු කිරීම ය. (4) සිරිත් විරිත් හා සම්ප්‍රදායන්ට ගරු කිරීම ය. (......)

**38.** පහත ආයතන අතුරෙන් විවිධ ක්ෂේත්‍රවලට අයත් කාර්ය ක්‍රියාත්මක කිරීමට උපදේශක කාරක සභා පිහිටුවිය හැකි ආයතනය කුමක් ද?
(1) පළාත් සභා (2) මහනගර සභා (3) නගර සභා (4) ප්‍රාදේශීය සභා (......)

**39.** මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් ඇතිවන පාරිසරික ගැටලු පමණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) ලැව්ගිනි, අම්ල වැසි, ඕසෝන් ස්තරය තුනී වීම
(2) සුළි කුණාටු, සුනාමි, අම්ල වැසි
(3) අම්ල වැසි, දේශගුණ විපර්යාස, ඕසෝන් ස්තරය තුනී වීම
(4) නියඟ, නායයෑම්, අම්ල වැසි (......)

**40.** සමස්ත ජාත්‍යන්තර ක්ෂේත්‍රය ම ආවරණය වන පරිදි ගොඩනගා ගෙන ඇති සංවිධානයක් වන්නේ කුමක් ද?
(1) පොදුරාජ්‍ය මණ්ඩලය (2) එක්සත් ජාතීන්ගේ සංවිධානය
(3) සාර්ක් සංවිධානය (4) නේටෝ සංවිධානය (......)

* *

[ හතරවැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

62 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2015

පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය I, II
குடியுரிமைக் கல்வி மற்றும் சமூக நிர்வாகம் I, II
Citizenship Education & Governance I, II

## (62) පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය II

* **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.
* **පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** (i) සෘජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රම **දෙකක්** නම් කරන්න.

(ii) ජාතික රාජ්‍යය නිර්මාණය වීමේ දී පසු කළ වර්ධන අවස්ථා **දෙකක්** නම් කරන්න.

(iii) දේශපාලන පක්ෂ ක්‍රමයේ ස්වරූප **දෙකක්** නම් කරන්න.

(iv) භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේ දී යොදා ගන්නා නිෂ්පාදන සාධක **දෙකක්** සඳහන් කරන්න.

(v) නීතිපතිතුමාගේ කාර්ය **දෙකක්** ලියන්න.

(vi) සාධාරණව හා අප්‍රමාදව යුක්තිය පසිඳලීම සිදු නොවීම හේතුවෙන් සිදු විය හැකි අවාසි **දෙකක්** දක්වන්න.

(vii) සාගර ජලය අපවිත්‍ර වීමට බලපාන දූෂණ කාරක **දෙකක්** සඳහන් කරන්න.

(viii) ප්‍රබල රාජ්‍ය දුබල රාජ්‍ය කෙරෙහි බලපෑම් ඇති කරන ක්ෂේත්‍ර **දෙකක්** සඳහන් කරන්න.

(ix) ධනවාදී අර්ථ ක්‍රමයක මූලික ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(x) වර්තමානයේ රටවල්වලට විදේශාධාර සපයනු ලබන ක්‍රම **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 × 10 = 20 යි)

**2.** රටක යහපාලනය ඇති වීමට ප්‍රජාතන්ත්‍රවාදය නිසි ලෙස ක්‍රියාත්මක විය යුතු ය.

(i) ඈත අතීතයේ ශ්‍රී ලංකාවේ හා ඉන්දියාවේ පැවති පාලන ක්‍රම තුළ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයේ ඇතැම් ලක්ෂණ පැවති බවට එක් රටකින් **එක්** නිදසුන බැගින් දක්වන්න. (ලකුණු 02 යි)

(ii) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක දැකිය හැකි අංග ලක්ෂණ **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක නිදහස් ජනමාධ්‍ය මගින් ඉටු කළ යුතු කාර්ය **තුනක්** දක්වා, ඉන් **එකක** වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

**3.** වර්තමාන ලෝකයේ බොහෝ රටවල් බහු සංස්කෘතික සමාජ ලෙස හැඳින්විය හැකි ය.

(i) බහු සංස්කෘතික සමාජයක් බිහිවීමට බලපාන සාධක **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) බහු සංස්කෘතික සමාජයක පැවැත්ම සඳහා යහපාලනයක් තුළ තිබිය යුතු ගුණාංග **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) බහු සංස්කෘතික සමාජයක ජනතාව එකමුතුව සහයෝගයෙන් ජීවත්වීමට අවශ්‍ය වන්නේ ඇයි දැයි කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

**4.** ජනතාව සිය අවශ්‍යතා හා උවමනා පිරිමසා ගැනීම සඳහා විවිධ ආර්ථික ක්‍රියාවල නිරත වෙයි.

(i) 'උවමනා' යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ii) සමාජවාදී අර්ථ ක්‍රමයක මූලික ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) වෙළෙඳපොළ අර්ථ ක්‍රමයක් යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද?

(b) වෙළෙඳපොළ අර්ථ ක්‍රමයක් ඇති වීම කෙරෙහි බලපෑ හේතු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 05 යි)

[පස්වැනි පිටුව බලන්න.

**5.** ගැටුමක් නිර්මාණය වීම සඳහා පුද්ගලයින් අතර ඇතිවන විවිධ මතවාද හා නොරිස්සුම් ස්වභාව හේතු විය හැකි ය.

(i) සරල බවේ සිට සංකීර්ණ බව දක්වා පෙළගැස්වීමට අනුව ගැටුමක මුල් අවස්ථා **දෙක** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) ගැටුමක් නිරාකරණය කරගැනීමේ දී ගැටුමට සම්බන්ධ සියලු පාර්ශ්ව විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ගැටුම් සාමකාමීව විසඳා ගැනීමෙන් අත්වන වාසි **තුනක්** දක්වා ඉන් **එකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

**6.** නීතිය නොදැන සිටීම නිදහසට කරුණක් නොවන බැවින් සෑම පුරවැසියකු විසින් ම නීතිය පිළිබඳ අවබෝධයක් ලබාගත යුතු ය.

(i) නීතියේ ගුණාංග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) අපරාධ නීතිය යටතේ දඬුවම් ලැබිය හැකි වැරදි **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන අධිකරණ වර්ග **තුනක්** නම් කොට, ඉන් **එකක** ක්‍රියාකාරීත්වය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

**7.** තිරසාර සංවර්ධනයක් සඳහා සම්පත් ඥානාන්විත ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

(i) තිරසාර සංවර්ධනයක් සඳහා සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ පරිසර සංරක්ෂණයට අදාළ පනත් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) පරිසර සංරක්ෂණය සඳහා පුරවැසියකු සතු වගකීම් **තුනක්** සඳහන් කර, ඉන් **එකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

* * *